# ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය
# ஸ்ரீ லங்கா நிருவாக சேவைச் சங்கம்
# SRI LANKA ADMINISTRATIVE SERVICE ASSOCIATION

## මාධ්‍ය නිවේදනය

### සාමකාමී විරෝධතාවයක නිරත වූ මහජනතාව වෙත එල්ල වූ ප්‍රහාරයේ වගකිව යුත්තන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම

2022-05-09 දින අරලිය ගහ මන්දිරයට ඒකරාශී වූ පිරිසක් ඒ ඉදිරිපිට හා ගාලු මුවදොර සාමකාමී විරෝධතා දක්වමින් සිටි මහජනතාව ඉලක්ක කොට ගෙන දියත් කරන ලද ම්ලේච්ඡ ප්‍රහාරය ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය දැඩි පිළිකුලෙන් යුතුව හෙළා දකිමු. හදිසි නීතිය ද ක්‍රියාත්මක කර ඇති අවස්ථාවකදී සාමකාමී විරෝධතාවක නිරත වූ නිරායුධ මහජනයා වෙත මෙවැනි ප්‍රහාරයක් එල්ලවීම වැලැක්වීම සඳහා රටේ ආරක්ෂක අංශවලට නොහැකි වීම විමතියට කාරණයක් මෙන්ම ඉතා බරපතල තත්ත්වයකි.

මෙවැනි තත්ත්වයක් ඇති වීමට අනියමින් අනුබල දීම සම්බන්ධයෙන් හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් වගකීම භාරගත යුතු බව අප සංගමය අවධාරණය කරන අතර, මහජනයා ආරක්ෂා කිරීමේ වගකීම පැවරී ඇති මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ පොලිස්පතිවරයා දැඩිව තම වගකීම් පැහැර හැර ඇති බව අප සංගමයේ නිරීක්ෂණයයි.

එසේම, පාර්ලිමේන්තු මන්ත්‍රී ජොන්ස්ටන් ප්‍රනාන්දු හා පාර්ලිමේන්තු මන්ත්‍රී සනත් නිශාන්ත ඇතුළු මහජන නියෝජිතයන් පිරිසක් 2022-05-09 දින අරලියගහ මන්දිරයට පිරිස් කැඳවා ඔවුන් සංවිධානාත්මකව මහජනතාවට පහර දීම සඳහා පෙළඹවෙන ආකාරයේ ප්‍රකාශ නිකුත් කරන ලද බවත්, පාර්ලිමේන්තු මන්ත්‍රී සනත් නිශාන්ත මහතා සෘජුවම අදාළ පහරදීම සිදු කරන පුද්ගලයින් පෙළඹවීම සඳහා කටයුතු කළ බවත්, බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා ද මොවුන් සමග ගමන් කළ බවත් සමාජජාලා වල සංසරණය වන රූපරාමු වලින් පෙනී යයි. එමෙන්ම බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම ක්‍රියාව සඳහා බන්ධනාගාර රැඳවියන් යොමු කර තිබූ බව ද සමාජ ජාල හරහා සංසරණය වූ වීඩියෝ දර්ශන නැරඹීමේදී නිරීක්ෂණය වේ.

තව ද, පළාත් පාලන ආයතන ප්‍රධානීන් විසින් අදාළ ආයතනවල සේවකයින් බලහත්කාරයෙන් කැඳවා ගෙන පැමිණ මෙම ම්ලේච්ඡ ක්‍රියාව මෙහෙයවීමට කටයුතු කර ඇති බව ද අප සංගමය වෙත වාර්තා වී ඇත.

ඒ අනුව, මෙම ම්ලේච්ඡ ක්‍රියාවට සම්බන්ධ වූ සහ ආධාර, අනුබල දුන් සියලු පාර්ශව සම්බන්ධයෙන් වහාම විධිමත් පරීක්ෂණ පවත්වා නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන මෙන් අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා සිටිමු.
ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

**පදුල ශ්‍රී රෝහණ ද සිල්වා**
ගරු සභාපති

**ප්‍රදීප් ලක්ශාන්ත**
ගරු ලේකම්

**2022.05.10**

**23 සී, සමුළු නිවාස, කැප්පෙටිපොල මාවත, කොළඹ 05.** **23 சீ, சமிட் தொடர்மாடி,கெப்பிட்டிப்பொல மாவத்தை, கொழும்பு-05.**
**23C, Summit Flats, Keppetipola Mw., Colombo 05.**
**දුරකතනය/ தொலைபேசி/Telephone : 011 5766855** **ෆැක්ස්/தொலைநகல்/ Fax : 011 2058027**
**විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/ Email : sasa.execo@gmail.com** **වෙබ් අඩවිය/இணையத்தளம்/ Web: www.sasa.lk**